පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

දෙවන වාරය - ඇගයීම 2 - සතිය - 02

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

1- කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

  - නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1. "දො දොංත තකු දොම්" යන බෙර පදයේ තාල රූපය වන්නේ,

   1. මහ තනි තිත  2. සුලු තනි තිත
   3. මැදුම් තනි තිත  4. සුළු මහ දෙතිත

2. "නෘත්‍ය ගීත බලා වැඩහිටින සිංහාසනය යි"යනුවෙන් සඳහන් වන්නේ,

   1. කොරවක් ගල් ලෙන් ලිපියේ ය  2. සැස්සේරුව සෙල්ලිපියේ ය
   3. තිසර සන්දේශයේ ය  4. කාලිංග වනෝද්‍යානයේ ගල්ආසන ලිපියේය

3. ශෝකය නමැති ස්ථායී භාවය නිසා උපදින රසය වනුයේ,

   1. කරුණා රසය  2. වීර රසය
   3. හාස්‍ය රසය  4. බීභත්ස්‍ය රසය

4. වාද්‍ය භාණ්ඩ පිළිබඳ නාමාවලියක් ඇතුළත් වන සන්දේශ කාව්‍ය ඇතුළත් වරණය වන්නේ,

   1. සැළලිහිණි සන්දේශය  2. පරවි සන්දේශය
   3. කොවුල් සන්දේශය  4. තිසර සන්දේශය

5. "එපා කියන තැන තැන නොසිටිල්ලා" මෙම කවිය අයත් නැටුම වන්නේ,

   1. ගොයම්  2. සවරම්
   3.ලී  4. කුලු

6. "තෙයිතක/// තෙයි" මෙය කුමන පා සරඹයේ සරඹ පදයද?

1.තුනපැති අඩිය		2. සුරල් අඩිය

3. චක්‍ර අඩිය		4. දෙපැති අඩිය

7. සබරගමු වන්නම් ගණනින්,

1. 32		2. 24

3. 18		4. 21

8. " ................. තක තොංග ..................... තරිකිට තග තොංග" හිස්තැනට අදාල වරණය වන්නේ,

1. තත් දොං, තරිකිට දොං		2. දොංකඩ, නංකඩ

3. තත් තොංග, තත්කඩ		4. තත් තොංග, දොංගත

9. "ලෙළදුන් නව තඹ පලුවන් පාදේ" මෙම කාව්‍යයේ දෙවන පදය වන්නේ,

1. තබමින් නිවරද මද්දලය නාදේ		2. අගනන් රග දුටුවන් සිතු පෑදේ

3. ගයමින් පානා ගීයෙන් කීදේ		4. නළගන නුවගණ රගන විලාදේ

10. භරත මුණිට අනුව රස ගණන වන්නේ,

1. 8	2. 9	3. 18	4. 12

ලකුණු 1×10 = 10

- හරි වැරදි ලකුණු කරන්න

1. ශෝකය නැමැති ස්ථායි භාවයෙන් උපදින්නේ කරුණා රසයයි. ( )
2. රංග උපකරණ භාවිතා කරන්නේ ගැමි නැටුම් වල දී පමණි. ( )
3. එකොළොස්වන පා සරඹය චක්‍ර අඩියයි. ( )
4. ශාන්තිකර්මවලදී භාවිතයට ගන්නා රංග උපකරණයක් ලෙස කුල්ල ගත හැකිය. ( )
5. උඩරට කලාසම ට සමාන සබරගමු නර්තන සම්ප්‍රදායේ පදය වන්නේ තීරුමාරුවයි. ( )

ලකුණු 2×5 = 10

- සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න

1. පහතරට වන්නම් ගණනින් ....................................................... කි.

2. දොළොස් වන පහ සරබ නාමය වන්නේ .......................................................ය

3. දේවදාසීන් සිටි බව හා ඔවුන් නර්තනයේ යෙදුණු බව සදහන් වන්නේ

........................................................ය.

4. වීර රසය උපදින්නේ .......................................................ස්ථායී භාවය මුල්කරගෙනය.

5. වෛයිරොඩි වන්නම .......................................................තනි තිතට නර්තනය කරයි.

ලකුණු 2×5 = 10

11 - කොටස

1. 1. මූලාශ්‍ර යනු මොනවාද කෙටියෙන් හදුන්වන්න (ලකුණු -05)

2. නර්තන කලාව පිළිබදව තොරතුරු සපයාගත හැකි මූලාශ්‍ර 5 ක් ලියන්න (ලකුණු -05)

2. 1. භාවයන් නිසා උපදින රස 3 ක් ලියන්න (ලකුණු -03)

2. එම රසයන් උපදින භාවයන් නම්කරන්න (ලකුණු -02)

3. නර්තනය හැදෑරීමේ ඇති ප්‍රයොජන 5 ක් ලියන්න (ලකුණු -05)

***

ශාන්තිකර්මවලදී රංග භාණ්ඩ භාවිතයට නොගැනේ.

පහතරට සින්දු වන්නම ක කොටස් ගණන 5කි.

පහතරට නර්තන සම්ප්‍රදායේ දී පැදුරේ උපත ගැන කියවෙන කවි ගයනා දක්නට ලැබේ.

සිංහරාජ වන්නම මහ තනි තිතට නර්තනය කරනු ලබයි.

සැස්සේරුව සෙල්ලිපිය අනුරාධපුර යුගයට අයත් මූලාශ්‍රයකි.